**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2013**

**------------------------------------------------------------------------**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 32(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 අහිතකර මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව ඉකුත් වර්ෂවල මිලදීගන්නා ලද පොත් අගය ශුන්‍ය වූ රු. 12,107,898 ක් වූ ස්ථාවර වත්කම්වල සාධාරණ අගය පොත්වලට ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 අනුව ආයතනයට එරෙහිව විභාග වන නඩු සම්බන්ධයෙන් විය හැකි අසම්භාව්‍ය වගකීම් සඳහා අවශ්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රු. 399,000 ක වටිනා මැණික් ගල් තොගයක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකර ජංගම වත්කම් යටතේ පාරිභෝජන ද්‍රව්‍ය තොග ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික අරමුදල් තැන්පතු ගිණුමේ ශේෂය රු. 1,604,602 ක් වුවද ඉදිරි වර්ෂයේ මාස දෙකක තැන්පතු හා අදාල පොළිය වූ රු. 164,982 ක්ද එම ශේෂයට එකතුකර තිබීම නිසා එකී ගිණුමේ ශේෂය රු. 164,982 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩාගාරයෙන් ප්‍රදානයක් ලෙස ආයතනයට දී තිබූ රු. 21,200,000 ක වටිනා වාහන 3 ක් ආයතනය නමින් ලියාපදිංචි කර තිබුණද ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම

මූලා්‍ය ප්‍රකාශනවල පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | බාහිර උපදේශක දීමනා | 460,232 | රාජකාරී පැමිණීමේ ලේඛන හා ශිෂ්‍යයන්ගේ පැමිණීම් ලේඛන |
| (ආ) | පාරිභෝජන ද්‍රව්‍ය තොග | 1,256,264 | තොග ලේඛන |
| (ඇ) | කපා හල පාරිභෝජන ද්‍රව්‍ය තොගය | 648,000 | තොග ලේඛන |
| (ඈ) | ගොඩනැගිලි කුළී ගෙවීම | 900,000 | කුළී ගිවිසුම |

### 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති සහ රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 25(6) වගන්තිය | මැණික් කර්මාන්තයට අදාල කටයුතුවල සක්‍රීය ලෙස නිරත විශ්වවිද්‍යාලයක හෝ පර්යේෂණ ආයතනයක නියෝජිතයෙකු ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කල යුතු වුවත් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (ii) 4.2.2 ඡේදය | ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා අරමුණු කෙරෙහි ළඟාවීම කොපමණවීද යන්න පිළිබඳ කාර්ය ඇගයීම් සඳහා පාලන අධිකාරී විසින් මාසිකව රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් වාර 6 ක් පමණක් පවත්වා තිබුණි. |
| | (i) 5. 1.2 ඡේදය | ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් කාර්යයන් සඳහා වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන නොතිබුණි. |
| | (iii) 5.1.3 ඡේදය | වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ක්‍රියාකාරී සැලැස්ම සමඟ අනුමත වාර්ෂික අයවැය ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ රු. 12,245,839 ක මුදල භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන 2014 වර්ෂයේදී මිලදී ගැනීම් කටයුතු සඳහා යොදවා තිබුණි.

(ආ) ආයතනයේ සේවකයින්ට 2012 වර්ෂයේ ඉතිරි කරගත් නිවාඩු සඳහා රු. 901,150 ක දීමනා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ) අනුමත සේවක සංඛ්‍යාව තුළ නොමැති ප්‍රවාහන නිළධාරි තනතුරක වැඩ ආවරණය කිරීම වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පාලන අධිකාරියේ අනුමැතිය මත මාසිකව රු. 1,500 බැගින් 2007 අප්‍රේල් සිට 2013 දෙසැම්බර් දක්වා රු 121,500 ක මුදලක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,117,229 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය
රු. 207,392 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු. 909,837 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙම පිරිහීම කෙරෙහි ගිවිසුම්ගත සේවා වියදම් රු. 3,628,890 කින් හා නඩත්තු වියදම් රු. 642,901 කින් වැඩි වී තිබීම සහ පුහුණු පාඨමාලා ගාස්තු ආදායම රු. 1,279,144 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 ලාභදායිත්වය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරකට අදාලව ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ආදායම- රජයේ දායකය | 45,133,065 | 43,481,200 | 39,919,040 | 34,207,079 | 30,650,891 |
| ආයතනයේ ආදායම | 4,462,639 | 5,931,354 | 3,696.415 | 2,745,498 | 2,898,980 |
| | 49,595,704 | 49,412,554 | 43,615,455 | 36,952,577 | 33,549,871 |
| වියදම | 50,712,933 | 49,619,946 | 43,232,376 | 37,731,537 | 32,905,323 |
| අතිරික්තය/(ඌනතාවය) | (1,117,229) | (207,392) | 383,079 | (778,960) | 644,548 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය වර්ෂ හතරක කාලයක් තුළ සියයට 273 කින් පිරිහී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ වියදම් සඳහා රජයේ දායකත්වය ලෙස රු. මිලියන 45. 1 ක් ලැබී තිබුණද වර්ෂයේ මුළු වියදම රු. මිලියන 50. 7 ක් විය. මේ අනුව ආයතනයේ සමස්ථ වියදමින් සියයට 89 ක් රජයේ ප්‍රදානවලින් ආවරණය කර තිබුණි.

### 3.3 ආයතනයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

නොදන්වා සේවයට නොපැමිණීම හේතු කොටගෙන සේවය අත්හිටුවා තිබූ ආයතනයේ සේවකයෙකු විසින් ආයතනයට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වර්ෂ හතරක කාලපරිච්ඡේදයක් තුළ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුකිරිමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම පිණිස මහා භාණ්ඩාගාරයෙන් අනුමත කර තිබුණද, එකී කාලය තුළ ව්‍යාපෘතිය නිම කර නොතිබූ අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමක්ද සිදු කර නොතිබුණි. ව්‍යාපෘති යෝජනාව අනුව වසරකට පළාත් දෙකක ගවේෂණ කටයුතු නිමකල යුතු වුවත්, 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල හා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පමණක් ආවරණය කර තිබුණි. මේ සඳහා වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 37 ක් වැය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට ජූලි දක්වා ක්ෂේත්‍ර පරීක්ෂණ කර පරිසර හිතකාමී මැණික් ගැරීම් තාක්ෂණය භාවිතයෙන් කැණීම් සිදුකල යුතු ක්‍රම හඳුනාගෙන තිබුණද, මෙම ක්‍රමය සම්බන්ධිත පාර්ශවයන් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සංවර්ධනය / වැඩිදියුණු කිරීම :

i. ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු පුහුණු වැඩසටහන් හයක් සහ උතුරු නැගෙනහිර පළාතේ නව පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භකිරීමේ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම මානව සම්පත් සංවර්ධනයට වැය කිරීමට ඇස්තමේන්තු කර තිබුණු රු මිලියන 5.2 ක් අදාල කාර්යය සඳහා වැය කර නොතිබුණි.

ii. ඉකුත් වර්ෂයේදී විලාසිතා ආභරණ නිෂ්පාදනය හා ආභරණ සඳහා ගල් බැඳීම සඳහා පිළිවෙලින් ශිෂ්‍යයින් 24ක් හා 9 ක් ලියාපදිංචි වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම පාඨමාලා සඳහා කිසිදු ශිෂ්‍යයකු ලියාපදිංචි වී නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේදී ආරම්භකර සමාලෝචිත වර්ෂය තුළදීම අවසන් කර තිබූ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 324 ක් වුවත් එම පාඨමාලා සාර්ථකව අවසන් කර තිබුණේ ශිෂ්‍යයින් 231 ක් පමණි. එය ලියාපදිංචි සිසුන්ගෙන් සියයට 71 ක් පමණ විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයෙකු විසින් සිදු කරන ලද රු. 2,395,749 ක රන් රිදී වංචාවට අදාළව අය විය යුතුව තිබූ රු 1,495,745 ක් හා එම නිලධාරියාට ගෙවා තිබූ වාහන ණය රු. 56,250 ද ඊට අදාල පොළියද අය කරගැනීමට ක්‍රියා නොකර අදාල නිළධාරියා සේවයෙන් ඉවත් කර තිබුණි.

(ආ) ආයතනයට අදාලව ආයතන කාර්යය පටිපාටිය සකස් කරගැනිම සඳහා 2012 ජූනි 12 දින රු. 634,000 ක මුදලකට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව එකී කාර්යය මාස 3 කින් නිම කල යුතු බවත් ප්‍රමාද වන දිනකට රු. 500 බැගින් ප්‍රමාද ගාස්තු අය කල යුතු බවත් දක්වා තිබුණි. මේ සඳහා ගිවිසුමට එළඹීමට ප්‍රථම එනම් 2012 මැයි 31 දින සියයට 50 ක අත්තිකාරම් මුදල වූ රු. 317,000 ක් ගෙවා තිබූ නමුත් 2014 ජූනි වන විටත් එකී කාර්යය ඉටුකරවා ගැනිමට ආයතනය අපොහොසත් වී තිබුණි.

**4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ජුලි 4 දින රු 10,977,344 කට මිලදීගෙන තිබූ අධි තාක්ෂණික විදුලි උදුන 2014 ජූනි වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) දිනපතා ජාතික ගීය වාදනය කිරීම සහ ප්‍රධාන රැස්වීම් ආවරණය පිණිස මිලට ගෙන තිබූ රු 104,000 ක් වටිනා ශබ්දවාහිනී උපකරණ කට්ටලය 2014 ජූනි වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) 2007 වර්ෂයේදී රු. 12,309,013 ක පිරිවැයක් දරා හුවිදුම් යන්ත්‍රයක් මිලදීගෙන තිබූ අතර එම යන්ත්‍රය සේවා කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු. 15,270 ක්ද 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රක්ෂණාවරණ ලබාගැනීම වෙනුවෙන් රු. 564,888 ක මුදලක් දරා තිබුණි. එසේ වුවත් මෙම යන්ත්‍රය සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබූ අතර ඉකුත් වර්ෂවලදීද යන්ත්‍රයේ නියමිත ධාරිතාවයෙන් භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුළියට ගැනීමේදී මාසිකව කුළිය රු. 600,000 ක් වූ අවම ලංසුව පසුව රු. 700,000 ක් වශයෙන් වෙනස්කරවා ගෙන තිබුණි. කෙසේ වුවද මාසික කුලිය රු. 727,488 ක් වූ දෙවන ලංසුපතේ කුලිය රු. 700,000 කට අඩුකරවාගෙන ආයතනය විසින් පිළිගෙන තිබුණි. මෙසේ කුලියට ලබාගත් ගොඩනැගිල්ල අදාල පිරිවිතරවලට අනුකූල නොවූ අතර විදුලි සම්බන්ධතාවයේ දෝෂ නිසා ඇතැම් පර්යේෂණ උපකරණ, වායුසමීකරණ යන්ත්‍ර හා කාර්යාල උපකරණ ක්‍රියාත්මක කිරීමේදී නිරන්තරයෙන් විදුලිය විසන්ධි වන බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් සේවක ණය සඳහා අයකරන පොළියෙන් සේවක ණය ලබාදීම සඳහා වෙනම අරමුදල් ගිණුමකට රු. 819,000 ක් බැර කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී එම අරමුදල උපයෝගී නොකර රජයේ ප්‍රදාන වලින් රු. 194,566 ක ණය ලබා දී තිබුණි.

(ඇ) හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු විසින් එවකට සිටි සභාපතිට( පෞද්ගලික නාමයට) එරෙහිව මානව හිමිකම් කඩකිරීම යන කාරණාව මත මහනුවර දිසා අධිකරණයේ රු. 5,000,000 ක වන්දි මුදලක් ඉල්ලා නඩුවක් ගොනුකර තිබුණි.මෙම නඩුව නිල තත්ත්වයේ නඩුවක් නොවූවද ඒ සඳහා ආයතනය විසින් නීති වියදම් ලෙස රු. 219,600 ක් දරා තිබුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළ නිලධාරියෙකු මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත පූර්ණ කාලීනව උපදේශකවරයෙකු ලෙස බඳවාගෙන මාසිකව රු. 85,000 බැගින් 2011 අප්‍රේල් සිට 2013 දෙසැම්බර් දක්වා රු. 2,805,000 ක මුදලක් ගෙවා තිබූ අතර මීට අමතරව නිවසේ සිට රාජකාරි ස්ථානයට ප්‍රවාහන පහසුකම්ද සපයා තිබුණි.

(ආ) රත්න විද්‍යාව හා මැණික් කැපුම් කර්මාන්තය ආශ්‍රිත එක් දින වැඩමුළුවට සමගාමීව සංවිධානය කර තිබූ ක්ෂේත්‍ර චාරිකාව වෙනුවෙන් ප්‍රවාහන ගාස්තු ලෙස රු. 25,060 ක් හා සංග්‍රහ වියදම් සඳහා රු. 20,000 ක් දරා තිබුණද එවැනි ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කල බව තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයේදී ඉදිරිපත් නොවීය.

## 4.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මැණික් නිධි ගවේෂණ හා තක්සේරුකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 11,393,846 ක වියදමක් දරා තිබුණි. ඉන් සියයට 57 ක් වැටුප් හා අතිකාල සඳහාද සියයට 18 ක් ඉන්ධන නිවාස කුළී සහ වෙනත් වියදම් සඳහා දරා තිබුණි.ව්‍යාපෘතියේ මූලික අරමුණ ඉටුකර ගැනීමට යොදා තිබුණේ මුළු වියදමෙන් සියයට 25 ක් පමණක් වන අතර 2011 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණු මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ජූලි දක්වාම නිමකර නොතිබුණි.

## 4.7 කාර්යය මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ එක් එක් කළමනාකරණ මට්ටම්වල අනුමත කාර්යය මණ්ඩලය 133 ක් වූවද තථ්‍ය කාර්යය මණ්ඩලය 48 ක් විය. මේ අනුව පුරප්පාඩු වූ තනතුරු සංඛ්‍යාව 85 ක් වූ අතර එම තනතුරු සඳහා බඳවාගැනීමට කාලීනව පියවර ගෙන නොතිබුණි.

(ආ) සේවකයන් බඳවාගැනීම සඳහා විභාග පැවැත්වීමේදී ලිඛිත පරීක්ෂණ සඳහා වූ ප්‍රශ්න පත්‍ර සැකසීම හා පිළිතුරු පත්‍ර පරීක්ෂාකිරීම ආයතනයේ නිළධාරීන් විසින්ම සිදුකරන බැවින් ස්වාධීනව බඳවාගැනීම් සිදුකරන බවට විගණනයට තහවුරු නොවුණු අතර, බඳවාගැනීමේ පරිපාටිය අනුව ලිඛිත පරීක්ෂණයේදී එක් ප්‍රශ්න පත්‍රයකට සියයට 40 කට වැඩියෙන්ද සාමාන්‍ය සියයට 50 ට වැඩි විය යුතු වුවද බඳවාගැනීමේදී ඒ අනුව තෝරාගැනීම් සිදු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 චක්‍රලේඛයේ 5.1.2 අනුව සංයුක්ත සැලැස්මට ඇතුළත් විය යුතු ආයතනයේ වර්තමානයේ පවතින සම්පත්, පසුගිය වසර තුනක මෙහෙයුම් ප්‍රතිඵලවල ප්‍රගතිය, සංයුක්ත සැලැස්මේ ඒ ඒ කාර්යයන් සඳහා වගකීම පැවරී ඇති නිළධාරීන් හඳුනාගැනීම සහ එක් එක් වර්ෂවල ඉලක්ක දැක්වීම (Performance Indicators) යනාදී තොරතුරු ඇතුළත් කර සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත තොරතුරු හා තථ්‍ය තොරතුරු අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදවාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත වැටුප් කාණ්ඩය අනුව ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරට හිමි වැටුප් කාණ්ඩය එච්එම් 2-1 හි පිහිටවිය යුතු නමුත් 2009 මැයි 01 දින සිට අධ්‍යක්ෂ ජනරාල් වරයා එච්එම් 2-3 වැටුප් කාණ්ඩයෙහි උපරිම වැටුප් පියවරෙහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පිහිටුවීම නිසා 2013 දෙසැම්බර් 31 දින වන විට රු. 617,400 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම මුදල එම නිළධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උසස්වීම් ලබාදීමේදී කළමනාකරණ සහකාර තනතුර දැරූ නිළධාරීන් 4 දෙනෙකුට එම නිළධාරීන් ලබමින් සිටි වැටුප් කාණ්ඩය වැටුප් පියවරයන් කිහිපයක් ඉදිරියෙන් වැටුප පිහිටුවීම නිසා එම නිළධාරීන්ට රු. 806,700 ක් වැඩිපුර ගෙවා තිබුණි.මෙයට අමතරව වැඩි වැටුප් පියවරයන්හි තබා තිබූ නිළධාරීන් දෙදෙනෙකු වෙනත් ආයතනවලට මාරු වී ගොස් තිබුණි.

(ඇ) පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාවේ ගනු ලැබූ තීරණ පිළිබඳව 2011 අංක 119 දරන පාර්ලිමේන්තු ප්‍රකාශනය මඟින් දැනුම් දී තිබූ නමුත් ආයතනයේ අවිධිමත් වැටුප් වැඩි වීම සම්බන්ධව නිළධාරීන්ට වැඩිපුර ගෙවූ වැටුප් නිවැරදි කර පැවති වැටුප් තලයේ නැවත පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ප්‍රසම්පාදනය
(ඇ) පර්යේෂණ කටයුතු සිදුකිරීම
(ඈ) වැටුප් ගෙවීම්
(ඉ) පාඨමාලා පැවැත්වීම
(ඊ) භාණ්ඩ සමීක්ෂණ
(උ) ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම